# සුළු පරිමාණ ධීවර කර්මාන්තය සවි බලගැන්වීම



ශ්‍රී ලාංකීය වෙරළබඩ තීරය විනාශ කරමින් 2004 දෙසැම්බර් 26 වැනිදා පැමිණි සුනාමි ව්‍යසනයෙන් එතෙක් භාවිතා කරමින් සිටි ධීවර යාත්‍රාවලින් 60%ක් පමණ විනාශ විය. ඒ අනුව ධීවර කර්මාන්තයෙන් යැපෙමින් සිටි 750,000ක පමණ වූ ධීවර ජනතාව සරණාභාවටය පත් විය. සිය ධීවර යාත්‍රා හා ආම්පන්න අහිමිවීම නිසා ඔවුන්ගේ ජීවනෝපායන් මෙන්ම සාමාන්‍ය ජන ජීවිතය ද අඩාල විය.

## ධීවර කර්මාන්තයේ වැදගත්කම

සුනාමිය රළ පැමිණීමට පෙර 171,000ක් පමණ ජනතාවත් වෙරළබඩ ආශ්‍රිත ධීවර කර්මාන්තයේ නියුතුවූ අතර ඔවුන් මෙරට සමස්ත මත්ස්‍ය නිෂ්පාදිතයෙන් 80%කට පමණ දායක විය. එමෙන්ම ජාතික ආදායමෙන් 2.5%ක පමණ දායකත්වයක් ලබාදෙන ලදී.

එපමණක් නොව වෙරළබඩ තීරය, කඩොලාන හා වෙරළබඩ ධීවර කලාප වැනි ස්වාභාවික සම්පත් සුරැකීමේදී ඒ සඳහා මූලික වෙමින් කටයුතු කරන්නේ මෙම ධීවර ජනතාවයි.

සිදුවූ හානි

- ධීවර පවුල්වල සාමාජිකයින් 7,573ක් මරණයට පත් විය.
- අලාභහානි සිදුවූ යාත්‍රා ගණන 15,500 - 20,000 ත් අතර වේ. (බහුදින යාත්‍රා 1200ක් ද සාම්ප්‍රදායික ඔරු 10000ක් ද මෝටර් බෝට්ටු 8,000ක්ද ඇතුළුව)
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන ධීවර වරාය 12න් 10ක්ම විනාශ විය.
- වෙරළබඩ මත්ස්‍ය හා අනෙකුත් ජලජ ජීවීන්ගේ අභිජනන ස්ථානයන් දැඩි ලෙස විනාශයට පත් විය.
- සුනාමියෙන් මාස ගණනක් ගතවූ පසු මෙරට මත්ස්‍ය පරිභෝජනය පහත වැටීම නිසා මාළු අලෙවි කිරීමට නොහැකි තත්ත්වයක් උදා විය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සාම්ප්‍රදායික ධීවර යාත්‍රා පිළිබඳ නවතම තොරතුරු www.janathakshan.org වෙබ් අඩවියෙන් ලබාගත හැකිය.

සුනාමි ව්‍යසනයෙන් හානියට ඛපත් ධීවර යාත්‍රාවන් පිළිසකර කිරීමට හා අහිමි වූ ධීවර යාත්‍රා වෙනුවට නවතම යාත්‍ර ලබාදීම සඳහා රාජ්‍ය ආයතන, රාජ්‍ය නොවන සංවිධාන සහ පෞද්ගලිකව ද බොහෝ දෙනෙක් ඉදිරිපත් විය. මෙහිදී වැඩි අවධානයක් යොමු වූයේ කුඩා හා මධ්‍යම පරිමාණ ධීවර යාත්‍රාවන් ලබාදීමටය. එහෙත් ධීවරයින් වෙත ප්‍රදානය කරන ලද යාත්‍රාවන් නිසි ප්‍රමිතියකින් නොතිබීම නිසා ඒවා භාවිතා කිරීමේදී විවිධ ගැටලුකාරී තත්ත්වයන් උද්ගත ඇති විය. ඒ ඒ ප්‍රදේශයේ අවශ්‍යතාවයන්ට මනාව ගැළපෙන සැකැස්මක් එම

වැඩි විස්තර සඳහා : ව්‍යාපෘති කළමනාකාර - ධීවර හෝ සම්පත් මධ්‍යස්ථානය

**ප්‍රැක්ටිකල් ඇක්ෂන් (අයි. ටී. ඩී. ජී)**

නො 5, ලයනල් එදිරිසිංහ මාවත, කොළඹ 5, ශ්‍රී ලංකා.

දුරකථන +94 (11) 2829412 ෆැක්ස් +94 (11) 2856188

වෙබ් අඩවි www.practicalaction.org www.janathakshan.org ඊ-මේල් srilanka@practicalaction.org.lk

ප්‍රාදේශීය කාර්යාල :

හම්බන්තොට දුරකථන +94 (11) 4379339 ඊ-මේල් southern@practicalaction.org.lk

අම්පාර දුරකථන +94 (11) 2224932 ඊ-මේල් eastern@practicalaction.org.lk

යාත්‍රාවල නොතිබීම නිසා ධීවරයින්ට පෙර පරිදි ඔවුන්ගේ ජීවන වෘත්තියේ යෙදීමට නොහැකි විය. තවද මෙම ධීවර යාත්‍රාවන් අදාළ ප්‍රදේශයේ පිහිටීම හා ධීවරයින්ගේ ප්‍රමුඛතාවයන් සහ අවශ්‍යතාවයන් වෙනස්වීම සම්බන්ධයෙන් ද නිසි අවධානයක් යොමුවී නොතිබුණි.

## ධීවර කර්මාන්තය නැවත නගාසිටුවීමේ ක්‍රියාවලිය තුළ හඳුනාගන්නා ලද අඩුපාඩු

- ප්‍රතිපාදන ලබාදිය යුතු ප්‍රතිලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාවලියට විවිධ ආයතනයන්ගේ හා පුද්ගලයන්ගේ බලපෑම් සහ මැදිහත්වීම් එල්ලවී තිබීම නිසා ඒ සම්බන්ධයෙන් සෑහීමකට පත් විය නොහැකිවීම.
- ධීවර ජනතාව නැවත නගාසිටුවීමේ ක්‍රියාවලියේදී එම ප්‍රජාවගේ සහභාගීත්වය අවමවීම නිසා ඔවුන්ගේ අවශ්‍යතා මොනව ද යන්න සම්බන්ධයෙන් නිසි වැටහීමක් නොතිබීම. තවද ලබාදෙන ලද සම්පත්වලින් ප්‍රයෝජනයක් ලබාගත නොහැකි තත්ත්වයක් ඇතිවීම.
- ධීවර ජනතාවට ස්වකීය ජීවිත යථාතත්ත්වයට පත් කරගැනීම සඳහා ඇති හැකියාව සහ ඔවුන් සතු ශක්තිය සම්පූර්ණයෙන්ම නොසලකා හැර තිබීම.
- අවශ්‍ය ප්‍රමාණයට වඩා ධීවර යාත්‍රා සැපයීම නිසා අධික ලෙස මසුන් මැරීමෙහි නිතරවීමෙන් අනාගතයේදී මත්ස්‍ය සම්පත් හිඟවීමේ තර්ජනයක් එල්ලවීම.
- ලබාදෙන ඇතැම් ධීවර යාත්‍රාවන් භාවිතා කර මුහුදු යාමට නොහැකිවීම.
- සහන වශයෙන් ලැබුණු ධීවර ආම්පන්න සහ අනෙකුත් උපකරණයන් භාවිතා කිරීමට නොහැකි තත්ත්වයේ පැවතීම නිසා ධීවරයින්ට විශ්වාසයකින් යුතුව මුහුදු යාමට නොහැකිවීම.
- විනාශ වූ යාත්‍රා අංගණයන් නැවත යථා තත්ත්වයට පත්කිරීම සම්බන්ධයෙන් අවම අවධානයක් යොමුවීම.
- පශ්චාත් සුනාමි ධීවර පුනරුත්ථාපන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් ජනතාව තුළ විශ්වාසයක් නොතිබීම.

ඉහත ගැටලු තවදුරටත් වර්ධනයවීම වළක්වාලමින් ධීවර ජන ජීවිතය යළි ගොඩනැගීමේ නව ප්‍රවේශයක් අවශ්‍යය.

## පශ්චාත් සුනාමි ධීවර ජන ජීවිතය යළි ගොඩනැංවීමේ අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ (අයි.ටී.ඩී.ජී.) ප්‍රවේශය

විපතට පත් ජනතාව හුදෙක් අසරණයන් නොව සිය ජීවිත නගාසිටුවීමේ දී භාවිතයට ගත හැකි ශක්තියක් දැනුමක් හා හැකියාවකින් යුත් ජන කොටසක්ය යන්න අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ (අයි.ටී.ඩී.ජී.) විශ්වාසයයි. තවද ප්‍රජා මූලිකත්වයෙන් සහ ප්‍රජා සහභාගීත්වයෙන් ඔවුන්ගේ වුවමනා එපාකම් හඳුනාගනිමින් ඔවුන්ව නගා සිටුවිය හැකිය.

## මෙකී ඉලක්ක සපුරාගැනීම සඳහා අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය අනුගමනය කරන ප්‍රවේශය



ඒ ඒ ප්‍රදේශවල ධීවරයින්ට අවශ්‍ය වන්නේ එකිනෙකට වෙනස් හැඩයෙන් යුත් ධීවර යාත්‍රාවන් ය. ඒ අනුව එම ධීවර ජනතාවට වඩාත් සුදුසු යාත්‍රාවක් නිර්මාණය කරගැනීම සඳහා පහත දැක්වෙන සාධකයන් අවබෝධ කරගැනීම වැදගත් වේ.

- ප්‍රදේශයේ මුහුදේ ස්වභාවය
- සුළඟේ වේගය
- මසුන් මැරීමේ ක්‍රම ආදිය

ඉහත සඳහන් කරනු ලැබූ මෙම කරුණු සම්බන්ධයෙන් මනා අවබෝධයක් ඇත්තේ එම ප්‍රදේශයේ ධීවර ප්‍රජාවටය. එබැවින් ධීවර යාත්‍රා ප්‍රතිසංස්කරණයේදී ඒ ඒ ප්‍රදේශයේ ධීවරයන්ගේ විශේෂ අවශ්‍යතා සම්බන්ධයෙන් සැලකිලිමත්වීම සහ අවධානය යොමු කිරීම වැදගත් වේ.

PRACTICAL ACTION
Intermediate Technology Development Group

## ඔබගේ ප්‍රයත්නයට අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය (අයි.ටී.ඩී.ජී.) උපකාරී වන්නේ

- ධීවර ප්‍රජාවගේ සහභාගීත්වයෙන් ධීවර යාත්‍රා තනන්නේ කෙසේ ද?
- වෙරළ සම්පත් කළමනාකරණයේදී එය ප්‍රජා මූලිකත්වයෙන් සිදු කරන්නේ කෙසේ ද?
- කුඩා පරිමාණ ධීවර ක්ෂේත්‍රයට අදාළ වෙළඳපොළ ක්‍රියාදාමය ශක්තිමත් කරන්නේ කෙසේද? (සහභාගීත්ව වෙළඳපොළ ක්‍රියාදාමය විශ්ලේෂණය (PMCA) යන ගැටලු සඳහා විසඳුම් සොයමිනි.

මෙම අංශවලින් පුහුණු හා හැකියා වර්ධනය ලබාදීමේදී,

- ධීවර ප්‍රජා සහභාගීත්වයෙන් හා මූලිකත්වයෙන් ධීවර යාත්‍රාවන් සැකසීමේදී ඒ සඳහා,

  ධීවර ප්‍රජා සහභාගීත්ව ලබාගැනීම සඳහා ප්‍රජා ප්‍රවේශය ලබාගන්නේ කෙසේ ද යන්න ගැන දැනුවත් කරයි.

  ෆයිබර්ග්ලාස් ඔරු සහ දැව කට්ටුමරන් ඉදිකිරීමේ තාක්ෂණය පිළිබඳ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙයි.

  මෙම පුහුණුව රාජ්‍ය හා රාජ්‍ය නොව සංවිධානවල ක්‍රියාකාරී නිලධාරීන්ට සහ සාම්ප්‍රදායික ඔරු හා බෝට්ටු සැකසීමේ නිරතවන නාවික ඉංජිනේරු ශිෂ්‍යයන්හට ලබාදෙයි. ධීවර ප්‍රජාවට මේ සම්බන්ධයෙන් ප්‍රායෝගික පුහුණුවක් පමණක් ලබාදෙයි.

- යළි පදිංචි කරවනු ලබන ධීවර ප්‍රජාව සඳහා ප්‍රවේශ මාර්ග තැනීම. (ධීවර බිම් හා වෙළඳපලට පිවිසීමේ මාර්ග තැනීම.)

## අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ (අයි.ටී.ඩී.ජී.) හි විශේෂඥතාවයන්

දශකයකට අධික කාලයක් තිස්සේ අන්තර්මාධ්‍ය තාක්ෂණික සංවර්ධන සමූහය සකසුරුවම් තාක්‍ෂණය භාවිතා කරගනිමින් වැඩි දියුණු කරන ලද්දකි ආපදා අවම කරගැනීමේ ක්‍රමවේදය. ස්වාභාවික අනතුරුවලට මුහුණදීමේ අවදානමක් සහිතව ජීවත්වන ජනතාවට සිදුවිය හැකි ද්‍රව්‍යමය හා ආර්ථිකමය හානිය අවම කරගැනීම සඳහා මෙම ක්‍රමවේදයන් සාර්ථකව භාවිතා කළ හැකිය. තවද මෙම අත්දැකීම් පාදක කරගනිමින් අයි.ටී.ඩී.ජී. ආයතනය සුනාමියෙන් විපතට පත් ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවාලීම සඳහා ආධාර කිරීමට ඉදිරිපත්වන ආයතනයන්ට සහ පුද්ගලයින්ට අවශ්‍ය තොරතුරු හා සහය ලබාදෙයි.

විශේෂයෙන් මතු දැක්වෙන ක්ෂේත්‍ර සඳහා ආධාර, උපකාර කිරීම් සහ තොරතුරු සපයයි.

- පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ සහ පුනරුත්ථාපන වැඩසටහන්වල මූලිකත්වය ජනතාවට ලබාදෙන්නේ කෙසේද? අපගේ තාක්ෂණික ක්‍රමවේදයන් සැකසීමේදී සමාජයෙන් ඈත් කරන ලද ජනතාවට මූලිකත්වය ලබාදීම සඳහා විශේෂ අවධානයක් යොමුකර ඇත.

(අන්තර්මාධ්‍ය තාක්ෂණික සංවර්ධන සමූහයේ සෑම ව්‍යාපෘතියක්ම සකස් කර ඇත්තේ ප්‍රජා දැනුම හා උපදෙස් ලබාගැනීමේ ප්‍රවේශය ඔස්සේ ජනතාවට අවශ්‍ය දේ ඔවුන් සමඟ සිටිමින් සැලසුම් සකස් කළ හැකි ආකාරයෙනි. උදාහරණයක් ලෙස ඉඩම් භාවිතය හා සැලසුම් කිරීමේ ක්‍රියාවලියේදී ජනතාවගේ අභිලාශයන් සහ ජීවන රටාවන් හඳුනාගනු ලැබේ. මෙහිදී සිතියම්කරණය, කණ්ඩායම් ක්‍රියා, සාමූහික ක්‍රියා, පරිසරයේ සැරිසැරීම සහ සම්මුඛ සාකච්ඡා ආදී උපක්‍රමයන් භාවිතා කරයි.)

- විනාශයට පත්වූ නිවාස හා පරිසරය යළි ගොඩනැගීමේ සැලසුම්වලදී ආපදා සංවේදී ප්‍රවේශයකින් යළි සැලසුම් කරයි, තවද අනාගතයේදී ආපදාවකට ලක්වීමේ අවදානමකින් සිටින ජනතාව සඳහා සැලසුම් සැකසීමේදී සිදුවිය හැකි හානිය අවදානම අවම කරන්නේ කෙසේ ද යන්න සලකා බලනු ලබයි.

වඩාත් සුදුසු බෝට්ටු තැනීම, සකසුරුවම් නිවාස ඉදිකිරීම, ගංවතුරට ඔරොත්තු දෙන නිවාස හා යටිතල (පාලම් සහ මං මාවත්) ඉදිකිරීම, ආපදාවලට ඔරොත්තු දෙන නිවාස තැනීම, නැවත නැවතත් ප්‍රයෝජනයට ගත හැකි බලශක්ති විකල්ප සෙවීම සහ වැසි ජලයෙන් වගා කිරීම සඳහා වැසි දිය රැස් කිරීමේ ක්‍රම පිළිබඳව තොරතුරු ලබාගත හැකිය.

# ප්‍රතිපත්තිමය ප්‍රකාශනය

## යළි ගොඩනැගීමේ ක්‍රියාවලියේදී අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහයේ මූලික ඇගයීම් හා අභිලාෂයන්

හැඳින්වීම

මිනිසාගේ මානව ක්‍රියාකාරකම් සිදුවන්නේ තමන් සතු ඇගයීම් හා විශ්වාසයන්ට අනුවය. ඒ අනුව මිනිසෙකුටම ආවේණික වූ එමෙන්ම සතු පුළුල් පරාසයක විහිදුණු ඒ ඒ විශ්වාස පද්ධතීන්ට අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය නිරන්තරයෙන් ගරු කරයි. නමුත් කාර්යයන් සැලසුම් කිරීමේ දී අපි යම් ප්‍රතිපත්තිමය රාමුවකට යටත්ව එය සිදු කරනු ලබන්නෙමු. අන්තර්මාධ්‍ය තාක්ෂණ සංවර්ධන සමූහය විසින් සිදු කරන කටයුතු පුද්ගලයින් දිරිමත් කිරීම සඳහා ප්‍රායෝගික භාවිතයක් හා ප්‍රවේශයක් ලෙස ඇගයීම් හා මූලික ප්‍රතිපත්තීන්ට අනුව කටයුතු සිදු කරන්නේමු.

නැවත නගාසිටුවීමේ කටයුතු සඳහා ප්‍රජාව, ස්වකැමැත්තෙන් සහභාගි කරවාගැනීම

භාවිතා කරන තාක්ෂණිකමය විකල්පයන් ප්‍රජාව මධ්‍යගත වූ එකක් විය යුතුය.

ඒ අනුව තාක්ෂණයන් භාවිතයේදී පහත සඳහන් දේවල් සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය.

- දැනට ජනතාවට ඇති ප්‍රශ්න හා අප කටයුතු කරන්නේ කා සමග ද යන්න
- ප්‍රජාවගේ අයිතීන්ට ගරු කිරීම.
- ප්‍රජාවන්ගේ උත්සාහයන්ට උදව් කරමින් ඔවුන්ගේ ජීවිතවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම.

සාමූහික යළි නැඟීසිටීමට

දිළිඳු ජනතාව සිය දුප්පත්කමට ස්වෝත්සාහයෙන් විසඳුම් සෙවීමට මහත් වෙහෙසක් ගනියි. එහෙත් සුනාමි ව්‍යසනයත් සමග ප්‍රධාන වශයෙන් ජීවිත අහිමිවීම් හා නිවාස අහිමිවීමත් සමග ඔවුන් මහත් සේ පීඩාවට පත්ව ඇත. ආර්ථිකමය අතින් ශක්තිමත් ජනතාවට වඩා මෙම තත්ත්වය හමුවේ මහත් සේ අසරණවී ඇත්තේ දිළිඳු ජනතාවයි.

යළි නැඟීසිටීමේ උත්සාහයන්හි සිදුවිය යුතු ආකාරය

ප්‍රජාවගේ මූලික අවශ්‍යතාවයන් හා ඔවුන්ගේ කැමැත්ත හඳුනාගත හැකි පරිදි තොරතුරු, දැනුම හා විකල්පයන් සකස්වීම මෙහි ප්‍රධාන අරමුණු විය යුතුයි.

විවිධත්වයට ගරු කිරීම

ස්ත්‍රී/පුරුෂභාවය/ජාතිය/කුලය/රැකියාව/ආගම ආදිය නොසලකා නැවත ගොඩනැගීමේ උත්සාහයන්වලදී ප්‍රජාවගේ මූලික මානව අයිතිවාසිකම්වලට ගරු කළ යුතුය. මේ සම්බන්ධයෙන් අදාළ ප්‍රජාව සමග කතාබහ කර වැඩසටහන් සැලසුම් කිරීම, සම්පත් ලබාදීමේදී එනම් නිවාස සැලසුම් කිරීමේ දී හා නිවාස බෙදා දීම්වලදී ප්‍රජාව විසින් පළ කරන ප්‍රායෝගිකව අදහස් සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් ඒවාට ගරු කළ යුතුවේ. එවැනි ක්‍රියාවලියන් ඔස්සේ ඔවුන්ගේ ජීවිත හා ජීවනෝපාය මාර්ගයන් ගොඩ නැගීමට දායක විය හැකිය.

අනාගත පරම්පරාව ගැන ද අවධානය යොමු කරමු

යළි නැඟීසිටීමේ උත්සාහයන් සහ ඒ සඳහා භාවිතා කරන තාක්ෂණික ක්‍රමවේදයන් තෝරා ගැනීමේදී එය ආර්ථිකමය, පාරිසරිකමය, සමාජයම හා ආයතනිකම වශයෙන් තිරසාර වූ එකක් බවට පත් කරගැනීම අරමුණ විය යුතුයි.